## ගිහාන් මල්ලී 28 පිටුව ඉවත් කරන්න

### දායකත්වය

□ මිදේරපිටියේ ගුණරතන හිමිපාණන් වහන්සේ, විහාරාධිපති, ශ්‍රී සුදර්ශනාරාමය, දියකඩුව - දෙමව්පියන්ට පිං පිණිස.

□ විශ්‍රාමලත් පාඨශාලාචාරිනී ඩී.ජ්. මහ

# නිවනට මග සදන

# ස්ථූප

පොකුණුවිට, ශ්‍රී විනයාලංකාරාරාම වාසී,

**පූජ්‍ය කුකුල්පනේ සුදස්සී ස්වාමීන් වහන්සේ**

**පුණ්‍යානුමෝදනාවයි**

**ආරච්චිගේ අබේරත්න පියාණන්ට හා විමලා විතානගේ මෑණියන්ට නිරෝගී සුව හා දීර්ඝායුෂ ප්‍රාර්ථනා කරමි.**

ජනිත ඉන්දික පුතණුවන් විසින් මෙම ධර්ම ග්‍රන්ථය මුද්‍රණය කර ධර්ම දනය පිණිස බෙද දෙන ලදී.

**ධර්ම දනය පිණිසයි.**

බු:ව: 2554

ක්‍රි:ව: 2010

**පූජ්‍ය කුකුල්පනේ සුදස්සී ස්වාමීන් වහන්සේගේ**
**වෙනත් ධර්ම ග්‍රන්ථ**

- බුද්ධ පූජාවේ යථාර්ථය
- සංඝික දානයක් දෙන විට
- බුද්ධ ප්‍රතිමාව සහ බෞද්ධකම
- ද්වේශය දුරු කරන්නේ කෙසේද(ධර්ම දේශනාවක් ඇසුරින්)
- දානය පාරමිතාවක් වන්නට නම් (ධර්ම දේශනාවක් ඇසුරින්)
- සිතේ සැබෑව (ධර්ම දේශනාවක් ඇසුරින්)
- නොනිමෙන මරණයේ නොමියෙන අරුත් (ධර්ම දේශනාවක් ඇසුරින්)
- නැණස වසන නීවරණ (ධර්ම දේශනාවක් ඇසුරින්)
- දානගෙන පිදිය යුතු කඨින චීවරය (ධර්ම දේශනාවක් ඇසුරින්)

පරිගණක අක්ෂර සංයෝජනය
**ඇස්. පී. සිරියලතා මහත්මිය**
**කල්‍යාණි සිරිවර්ධන මෙනවිය**
**(කොතලාවල රාජ්‍ය ආරක්ෂක විශ්ව විද්‍යාලය)**

පිටකවර නිර්මාණය
සාලිය ජයකොඩි

Maya
ග්‍රැෆික්ස් හොරණ - දුර : 0602-300999

**මුද්‍රණය:**
**සිකුරු ප්‍රකාශකයෝ**
144, වෙනිවැල්කොළ,
පොල්ගස්ඕවිට.
දුරකථන : 2704152, 2704832

ලොව්තුරා සම්මා සම්බුදු රජාණන් වහන්සේ අසූ වැනි වියේදී ආයු සංස්කාරය අතහැරලා තුන් මසකට පසු කුසිනාරා නුවර මල්ල රජ දරුවන්ගේ ''උපවත්තන'' සල් උයනට වැඩම කළා. සල් ගස් දෙකක් අතර, ආනන්ද හාමුදුරුවො පනවලා දුන් ආසනයෙ සැතපිලා ඉන්න අවස්ථාවෙ දස දහසක් සක්වල දිව්‍ය බ්‍රහ්මයින් එතනට ඒකරාශි වෙලා බුදුරජාණන් වහන්සේ දැකගන්නට ලැබෙන මේ අන්තිම මොහොතේ තම තමන්ගේ ශක්ති ප්‍රමාණයෙන් මලින්, සුවඳින්, තූර්‍ය නාදයෙන් තථාගතයන් වහන්සේට පූජා පැවැත්වූවා.

ඒ වෙලාවෙ ආනන්ද හාමුදුරුවො අහනවා, ස්වාමීනී බුදුරජාණන් වහන්ස, ඔබ වහන්සේ පිරිනිවන් පෑවට පස්සෙ ඔබ වහන්සේගේ ආදාහන පූජෝත්සවය මා කෙසේ පැවැත්විය යුතුද? එතකොට බුදුරජාණන් වහන්සේ දේශනා කළා, ආනන්ද ඔබ තවම සෝවාන් පුද්ගලයෙක්, ඔබට තවමත් අර්හත්වය සඳහා කරන්න බොහෝ දේ තියෙනවා. ඒ නිසා මගේ ආදාහන පූජෝත්සවය ගැන වෙහෙසෙන්නට ඕන නැහැ. ඔබ අර්හත්වය සඳහා අවශ්‍ය කටයුතු කරගන්න. ආදාහන පූජෝත්සවය කරන්නට තථාගතයන් වහන්සේ ගැන පැහැදුණු බොහෝ රජවරු, බ්‍රාහ්මණයෝ, ගෘහපතියො ඉන්නවා. ඒ අය කැමති ආකාරයෙන් ආදාහන පූජෝත්සවය කරාවි.

නැවත ආනන්ද හාමුදුරුවො අහනවා, ස්වාමීනී ඒ පිළිබඳව ඔවුන් පිළිපැදිය යුත්තේ කෙසේද? එහිදී බුදුහාමුදුරුවො දේශනා කරනවා, ''ආනන්ද සක්විති රජ කෙනෙක් මිය ගියාම කොහොමද ආදාහන පූජෝත්සවය කරන්නේ, ඒ වගේ කරන්න කියලා තථාගතයන් වහන්සේගේ ශ්‍රී දේහය පිළිබඳව ආදාහන කෘත්‍යය කරන හැටි අනුපිළිවෙලින් දේශනා කළා.

## ථූපාර්හ පුද්ගලයෝ

එතැනදි බුදුහාමුදුරුවො තවත් විශේෂ කරුණක් දේශනා කළා. "චත්තාරො මෙ ආනන්ද ථූපාරහා" ආනන්ද, මේ ලෝකයේ චෛත්‍ය හදලා වැඳුම් පිදුම් කළයුතු පුද්ගලයෝ හතර දෙනෙක් ඉන්නවා. "කථමෙ චත්තාරො" කවුද මේ හතර දෙනා? "තථාගතෝ අරහං සම්මා සම්බුද්ධො ථූපාරහො"

ආනන්ද, කල්ප කෝටි ගණනකින් මේ ලෝකයේ පහළ වෙන, චතුරසංඛ්‍ය කල්ප ලක්ෂයක් හෝ අටාසංඛ්‍ය කල්ප ලක්ෂයක් හෝ සොළසාසංඛ්‍ය කල්ප ලක්ෂයක් හෝ මේ ඝෝර භයංකර සංසාරයේ අපමණ දුක් කම්කටොළු විඳගෙන, සත්වයින් කෙරෙහි මහා කරුණාවෙන්, මහත් වූ මෛත්‍රියෙන් පාරමිතා සම්පූර්ණ කරලා යම් බෝසත් කෙනෙක් සම්මා සම්බුද්ධත්වයට පැමිණෙනවාද, උන් වහන්සේ බොහෝ සත්වයින් සසර කතරින් එතෙර කරලා යම් දිනෙක පිරිනිවන් පානවද, ඒ තථාගත වූ අර්හත් වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේ වෙනුවෙන් චෛත්‍ය පිහිටුවා වැඳුම් පිදුම් කරන්නට සුදුසුයි.

ඊලඟට යම්කිසි උතුමෙක් පච්චේක සම්බුද්ධත්වයට පැමිණෙනවද, ඒ උතුමන් වහනසේලා වෙනුවෙන් චෛත්‍ය පිහිටුවා වැඳුම් පිදුම් කරන්නට සුදුසුයි. ඒ වගේම තථාගතයන් වහන්සේගේ ශ්‍රාවක වූ රහතන් වහන්සේ හෝ අනාගාමි සකෘදාගාමි සෝවාන් හෝ එහෙමත් නැතිනම් වෙනත් සිල්වත් ගුණවත් පෘථග්ජන භික්ෂූන් වහන්සේ නමක් හෝ වේ නම්, ඒ උතුමන් වහන්සේලා වෙනුවෙනුත් චෛත්‍ය පිහිටුවලා වැඳුම් පිදුම් කරන්න සුදුසුයි. ඒ වගේම මේ ලෝකයේ පෘථගජන මනුෂ්‍යයෙකු වුණත් බොහෝ කාලාන්තරයක් මහා කුසල් වඩවලා ඒ කුසල ශක්තියේ බලයෙන්ම සක්විති පදවි ලැබගෙන පංචශීල ධර්මයෙහි පිහිටලා දසරාජ ධර්මයෙන් සියළු මනුෂ්‍යයන්ට යහපත සිද්ද කරන්නා වූ යම් සක්විති රජෙක් වෙත්ද, ඒ සක්විති රජවරුන් සිහිකරලා චෛත්‍ය පිහිටුවා වැඳුම් පිදුම් කරන්න සුදුසුයි. මේ ආකාරයට චෛත්‍ය පිහිටුවා වඳින්නට සුදුසු අය හතර දෙනෙක් ගැන



බුදුහාමුදුරුවො පැහැදිලි කළා.

එහෙම පැහැදිලි කරලා ආනන්ද හාමුරුවන්ට දේශනා කරනවා, ආනන්ද තථාගතයන් වහන්සේගේ ශරීරයෙන් ශේෂ වන ධාතූන් වහන්සේලා තැන්පත් කොට කරවන ලද ස්ථූපය කෙරෙහි යම් සැදැහැවත් මනුෂ්‍යයෙක් සිත පහදවා ගනීද, මලක් පහනක් හෝ පුදයිද, ඒ මනුෂ්‍යයාට අනන්ත වූ දීර්ඝ සංසාරයේ මහා යහපත පිණිස ඒ කුසල ශක්තිය පවතිනවා.

## වැඳිය යුත්තේ ඇයි ?

දස දහසක් සක්වල දිව්‍ය බ්‍රහ්මයින් ඇවිදින් මලින් ගඳින් සුවඳින් පූජා සත්කාර කරද්දී එය එතරම් උසස් කොට නොගත් තථාගතයන් වහන්සේ, තමන් වහන්සේ පිරිනිවන් පෑ පසු ධාතූන් වහන්සේට පවා ඇයි ද වැඳුම් පිදුම් කරන්නට කීවෙ? පින්වතුනි බුදුහාමුදුරුවො කාගෙවත් වන්දනාව අල්පමාත්‍රයකින්වත් බලාපොරොත්තු වුනේ නෑ. නමුත් බුදුරජාණන් වහන්සේට අවශ්‍ය වුණා මේ මනුෂ්‍යයෝ ප්‍රතිපත්තියට යොමු කරන්නට. ඒ සඳහා මනස යොමු කරවීමට මගක් වශයෙනුයි බුදු ගුණ සිහිකර වැඳුම් පිදුම් කරන්න අනුදැන වදාළේ. ආමිස පූජා නැතිවට කමක් නෑ, ප්‍රතිපත්තිය පමණක් ඇතියි කියන මිනිස්සු අවබෝධ කරගෙන නැහැ ඒ ප්‍රතිපත්තියට යොමු වෙන්නෙ කොහොමද කියලා.

ප්‍රතිපත්තිය කියන්නෙ කුමක්ද? අපේ සන්තානයෙ කුසල් සිතුවිලි සහ අකුසල් සිතුවිලි වශයෙන් දෙවර්ගයක් තියනවා. අකුසල් සිතුවිලි මැඩ පවත්වමින් කුසල් සිතුවිලි දියුණු කරන්නට පුළුවන්නම් එය ප්‍රතිපත්තියයි. මොනවද කුසල් සිතුවිලි? ශ්‍රද්ධාව, වීර්‍ය්‍යය, සතිය, එකඟ බව, ප්‍රඥාව, මෛත්‍රිය, කරුණාව, දයාව, උපේක්ෂාව. මේ ආදී කුසල් සිතුවිලි මනසේ වඩවන්නට පුළුවන්නම්, රෝපණය කරන්නට පුළුවන්නම්, පෝෂණය කරන්නට පුළුවන්නම් එසේ කරන්නා වූ වැඩපිළිවෙළට කියනවා ප්‍රතිපත්ති මාර්ගයයි - ප්‍රතිපත්තියේ පිහිටනවයි කියලා.

බුදුරජාණන් වහන්සේ ප්‍රතිපත්ති මග මැනවින් දැන ගෙන දේශනා කළා. කුමක්ද ප්‍රතිපත්තිය? අකුශලයෙන් බැහැර වෙලා කුසල් දියුණු කිරීමේ වැඩපිළිවෙල. නුවණ වැඩුණු අයට නම් පුළුවන් පිහනක් නැතත් බුදුගුණ සිහිකරන්න. බුදු පිළිමයක් නැතත්, බුදුරජාණන් වහන්සේ ජීවමානව නැතත් බුදුගුණ සිහිකරන්නට නුවණැත්තන්ට පුළුවන්. නමුත් හැමෝගෙම නුවණ එක පමණට වැඩිලා නෑ. බුදුහාමුදුරුවො මනුෂ්‍ය සන්තානවල මෙබඳු දුබල තැන් හඳුනන නිසා ඊට පිළියමක් වශයෙන් බුදුගුණ ඇගයීම තුළින් ප්‍රතිපත්ති මාර්ගයට යොමුවන වැඩ පිළිවෙලක් දේශනා කළා. තමන්ගේ ශක්ති ප්‍රමාණයෙන් තථාගතයන් වහන්සේ ගේ ගුණ සිහි කරන්න, සිතන්න, කල්පනා කරන්න, වඳින්න, පුදන්න දේශනා කළේ ඒ නිසයි. වඳිනවා පුදනවා ගරු කරනවා කියන මේ වචන ඔක්කොගෙන්ම කියන්නෙ කෙනෙකුගේ ගුණයක් පිළිබඳව මනසින් ඇගැයීම. යමෙකුගේ ගුණය හරියාකාරව මනසින් අගයන්නට පුළුවන් නම්, තමන් තුළත් ටිකෙන් ටික එබඳු ගුණ වැඩෙනවා. ඒකයි හැබෑ වන්දනාව.

අපි බුදු පිළිමයක් ඉදිරියට ගිහින් බොහෝ වේලා දොහොත් මුදුන් දී ගෙන පසඟ පිහිටුවා ගෙන සිටි පමණින් වැන්දා වෙන්නෙ නැහැ. නමස්කාර කළා වෙන්නෙ නෑ. ඒ සියල්ලක් කායික ඉරියව් පමණයි. ''ඒ තථාගතයන් වහන්සේට මාගේ නමස්කාරය වේවා'' කියලා සිය දහස් වර කිව්වත්, එය වචන ටිකක් පමණක් වෙනවා මනසින් ගුණ සිහි කරගෙන හැබෑ ගරුත්වයක් ඇති නොවෙනවා නම්. ඒ වගේම කායික ඉරියව් පැවැත්වීම හෝ වචනයෙන් යමක් ප්‍රකාශ කිරීම නොකළත්, මනසින් ගුණය සිහිකරද්දී ගුණයට නැමුණු, ගුණය වෙත ගරු කරන ස්වභාවයක් යම් සන්තානයක් තුළ පහළ වෙනවා නම් ඒකට කියනවා නමස්කාරය කිරීමයි, වන්දනා කිරීමයි කියලා.

## ද්‍රව්‍ය පූජා කිරීම



මේ සිතුවිලි වඩා පහසුවෙන් මතු කර ගැනීම සඳහා අපට පහනක් වැනි යමක් උපකාර කරගන්නටත් පුළුවන්. පහනේ ආලෝකය දිහා බලලා, තථාගතයන් වහන්සේගේ ප්‍රඥාව සිහිකරලා ඒ අනන්ත ප්‍රඥාවට මම නමස්කාර කරනවා, මේ පහන් ආලෝකයෙන් පුදනවා. තථාගතයන් වහනසේගේ අනන්ත ශීල සුගන්ධය ගුණ සුගන්ධය සිහි කරලා, මේ සුගන්ධ ධූපය ඒ තථාගතයන් වහන්සේට පූජා කරනවා යන හැඟීම ඇති කර ගන්න පහසුයි. මේ විදිහට සුවඳදුම් මල් පහන් ආහාර චීවර පුදන්නෙ ඒ ගුණයට අපේ මනස නැඹුරු කරන්නයි. කාලයක් තිස්සේ ගුණයට ගරු කරනකොට අපේ මනස තුළත් ගුණවත් භාවය ඇතිවෙන්න එය හේතු වෙනවා. අම්ම තාත්තගේ ගුණය අගයන දරුවාන්ගේ චයඞාව සැකසෙන්නේ අම්ම තාත්තා වගෙයි. ගුරුවරයාගේ ගුණය අගයන ශිෂ්‍යයා එබඳු ගුණාංගයන්ගෙන් සමන්විත මනුෂ්‍යයෙක් වෙනවා. යම් වීරයෙකුගේ චරිතාපදාන නිතර නිතර ගෞරවයෙන් සිහිකරන දරුවා යම් දවසක වීරයෙක් බවට පත් වෙනවා. ගුණවතෙකුගේ ගුණය ගැන නැවත නැවත සිතන්නා වූ මනුෂ්‍යයා යම් දවසක ගුණවතෙක් බවට පත් වෙනවා. එය එක්තරා චිත්ත නියාමයක්.

මේ පෘථග්ජන මනුෂ්‍යයින්ගේ ස්වභාවයක් තමයි නිරන්තරයෙන් අනුන්ගේ දෝෂය දැකීම. ඔබ අප කාගේත් හැටි එහෙමයි. ගුණවතුන් දහසක් දෙනා අතරේ එක් වැරදිකාරයෙක් සිටියොත්, ඒ දහසක් දෙනාගෙ ගුණය නෙවෙයි මිනිස්සු හිතන්නට පෙලඹෙන්නේ, වැරදිකාරයාගේ වැරද්දයි. ඔහුගේ වරද ගැන සිතන අපට මොකද වෙන්නේ? මනස තුළ ද්වේශය හටගන්නවා. කෝපය හටගන්නවා. වෛරය හට ගන්නවා. කෙලෙසෙන්නේ කවුද? අපේ චිත්ත සන්තානයමයි. අපි යම් අවස්ථාවක ගුණවතෙකුගේ ගුණ සිතන්නට, ගුණ අගයන්නට පුරුදු වෙනවා නම් ඒ තුළින් යම් දවසක අපේ මනසේ ගුණය වැඩෙනවා.

එහෙමනම් ප්‍රතිපත්තිය වෙත යන්නට - අකුසලය මැඩ පවත්වලා කුසලය වඩවන්නට ඕන. ගුණය වඩවන්නට නම්, ගුණය පළමුවෙන් අගයන්නට ඕනෑ. ගුණය අගයන්නට නම් ගුණයට ගරු කරන්නට ඕනෑ, නමස්කාර කරන්නට ඕනෑ. ප්‍රඥාවෙන් නොවැඩුණු මනුෂ්‍යයින්ට ඒ සඳහා යම්කිසි ආමිස පූද පිළිවෙතක් අනුගමනය කිරීම පහසුවක් වෙනවා. ඒ නිසයි බුදුහාමුදුරුවො දේශනා කළේ තථාගතයන් වහන්සේ පිරිනිවුණු කල්හි උන්වහන්සේගේ ගුණ සිහි කරලා ධාතු චෛත්‍යය පුදන්නටෙයි කියලා. එසේ යමෙකුගේ මනස ගුණය වෙත නැවෙනවද, ඒ තැනැත්තා මනුෂ්‍යත්වය වෙත පිවිසෙනවා. මනුෂ්‍යත්වය වෙත අවතීර්ණ වූ තැනැත්තා ප්‍රඥුවේ අගය වටහා ගන්නවා. ප්‍රඥුවේ අගය වටහා ගත් මනුෂ්‍යයා ප්‍රඥාවෙන් ක්‍රියාත්මක වෙනවා. ප්‍රඥාවන්තව ක්‍රියාකරන මනුෂ්‍යයා හැබෑ බෞද්ධයෙක් වෙනවා.

## බුද්ධ ශරීරය පූජනීය වීමට හේතු

සාමාන්‍ය මනුෂ්‍යයෙකුගේ කෙස්, ලොම්, නිය, දත් මේවා පූජනීයද? මේවා පිළිකුල් දේවල්. සාමාන්‍ය මනුෂ්‍යයෙකුගේ මිනී අළු ටිකක්, මිනී ඇට ටිකක් යම් ඉඩමක දැම්මොත් හූනියමක් හැටියටයි, මහා විපතක් හැටියටයි සලකන්නේ.

ලේ මස් ඇට නහර වලින්ම සෑදුම් ලද්දා වූ තථාගතයන් වහන්සේගේ ශරීරය කෙසේද පූජනීය වුනේ? අර මහා ප්‍රඥාව, අනන්ත කරුණා මෛත්‍රී ආදී ගුණයන් පූජනීය වුණා. ඒ ගුණ ස්පර්ශ වූ ලේ ධාතුවත්, මාංශයත්, කෙස්, දත්, අස්ථි, සියල්ලක්ම පූජනීයයි. ඒ කය ස්පර්ශ වූ චීවරය පවා පූජනීය වුණා. ඒ චීවරය සහිත කය ස්පර්ශ වූ, උන්වහන්සේ වැඩ සිටි අසුන පූජනීය වුණා. උන්වහන්සේ ඇසුරු කළා වූ බෝධීන්



වහන්සේ, දන් වැළඳූ පාත්‍රය පූජනීය වුණා. උන්වහන්සේ යම් දිසාවක වැඩ සිටියාද, යම් භූමියක් ස්පර්ශ කළාද ඒ භූමියේ වැලි දූවිලි පවා සදා වන්දනීය පූජනීය වුණා. ඒ නිසා තථාගතයන් වහන්සේගේ අනන්ත ගුණය ස්පර්ශ වූ ශරීරයේ අස්ථි කොටස් - සර්වඥ ධාතූන් වහන්සේලා යම් තැනක නිදන් කර, බුදුගුණ සිහිකර වඳිනවා නම් පුදනවානම්, ජීවමාන තථාගතයන් වහන්සේ ට වැන්දා හා සමානයි. පිදුවා හා සමානයි. හැබැයි බුදුගුණ සිහිකරගෙන වැඳුම් පිදුම් කළයුතුයි.

ඒ නිසා සියළු කල්හි ලෝකයේ මිනිසුන් හා දෙවි බඹුන් විසින් වන්දනීය වූ පූජනීය වූ තථාගත අර්හත් සම්මා සම්බුදු රජාණන් වහන්සේ ගේ සදා වන්දනීය වූ ධාතූන් වහන්සේලා තැන්පත් කොට මහාර්ඝ වූ ධාතු චෛත්‍යයක්, අපේ කාය ශක්තිය වැය කරලා කාලය ශ්‍රමය ධනය කැප කරලා මේ පුණ්‍ය භූමිය තුළ අපි ඉදි කරලා මහා කුසලයක් සිද්ධ කර ගත්තා කියලා සතුටු වෙන්න පුළුවන්.

## චෛත්‍යයේ පාදම

එම ධාතු චෛත්‍යය කෙසේ කෙසේ නිර්මාණය කරනවද, ඒ නිර්මාණය කරන ආකාරය අනුවත් කුසලය බලවත් වෙනවා. තථාගතයන් වහන්සේගේ ධාතු නිධන් කරලා ගොඩනගන්නා වූ චෛත්‍යයෙ පාදම යම්තාක් පොළවේ ගැඹුරට ඉදි කරනවාද, ඒ කුශලය ගැඹුරු ප්‍රඥාව ලබන්නට හේතු වෙනවා. රුවන්වැලි මහා සෑයෙ පාදම එක වරක් හදලා නිම කරලා පසු දින බලනකොට පාදම ගිලා බැහැලා. නැවතත් දුටු ගැමුණු රජතුමා මහ රහතන් වහන්සේලාගෙන් විමසලා අධෛර්යමත් නොවී නැවතත් පාදම ගොඩ නගනවා.

දෙවන දිනයේ බලනකොට නැවතත් පාදම ගිලා බැහැලා. නැවතත් හැදුවා, නැවතත් හැදුවා, සත්වාරයක් මේ පාදම ගිලා බැස්සා. කුමක්ද නිසාද? ඉදි කරන්නා වූ ධාතු චෛත්‍යය ස්වභාවික විපත් ආදියට ඔරොත්තු දෙමින් වසර දහස් ගණනක් ස්ථාවරව පැවතීමටත්, කරන්නා වූ මහා කුසලය ඒ දායකයාට මහත්ඵල මහානිශංස වෙන්නටත් අවශ්‍ය නිසා දෙවි දේවතාවන්ගේ සහ මහ රහතන් වහන්සේලාගේ උපකාරය එදා දුටු ගැමුණු මහ රජතුමාට ලැබුණා. දුටු ගැමුණු රජතුමා ඒ චෛත්‍යය ඉදි කළේ මහත් ශ්‍රද්ධාවෙන්. ඒ කුශලය එතුමාට ගැඹුරු ප්‍රඥාව ලබන්නටත්, අනාගත මෛත්‍රී බුද්ධ සාසනයේ පහළ වෙලා දහම් අවබෝධ කරන්නටත් උපනිශ්‍රය වෙනවා. ශක්තිමත්ව ස්ථාවරව චෛත්‍ය රාජයාණන් වහන්සේ ගොඩනගන්නට දායක වූ සම්බන්ධ වූ ඒ දෙවි දේවතාවන් ඇතුළු සියළු මනුෂ්‍යයෝ එම කුසල විපාකය අදත් ලබනවා.

කුඩා චෛත්‍යයක් වුණත් කලක් ස්ථාවරව පවතින්නට එහි පාදම හේතු වෙනවා. තථාගතයන් වහන්සේ අනන්ත කල්ප කාලාන්තරයක් මේ සසර ගමනේ පාරමී පුරා, සත්වයින්ට අනුකම්පාවෙන් සම්මා සම්බුද්ධත්වයට පැමිණ, දේශනා කළා වූ ලොව්තුරු දහම අවබෝධ කරන්නට තරම් ගැඹුරු වූ ප්‍රඥාවක් ලබන්නට මේ කුශලය අපටත් උපකාර වේවා කියලා ප්‍රාර්ථනා කරගන්න පුළුවන්.

## චෛත්‍ය ගර්භය

චෛත්‍ය රාජයාණන් වහන්සේ නමක් ඉදි කරන කොට අපි චෛත්‍ය ගර්භය තුළ ධාතු නිධන් කරනවා. අපි ඉහත සඳහන් කළා ධාතූන් වහන්සේලා සංකේතවත් කරන්නෙ කවුරුන්ද? සම්මා සම්බුදුරජාණන් වහන්සේ. ඒ අනන්ත



ගුණයෙන් යුක්ත වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ ධාතූන් වහන්සේලා ගර්භය තුළ යම්තාක් සුරක්ෂිත වෙනවාද, ඒ හා සමානව මේ ධාතු චෛත්‍යය සකසන්නට උපකාර කළා වූ, සම්බන්ධ වුණා වූ, දැක සතුටු වුණාවූ මනුෂ්‍යයින් පමණක් නෙමෙයි දෙවි බඹුන් ආදී සකල සත්වයින්ගේම සන්තානය තුළ ගුණ වඩවාගන්නට, ගුණය සුරක්ෂිත කරගන්නට මේ කුශලය උපකාරය වෙනවා.

පෘථග්ජන සත්වයින් තුළ පවතින එක්තරා දෝෂයක් තමයි, මේ ජීවිතයේ ශීල භාවනා ආදී ගුණ ධර්ම පුරලා ඊලඟ ආත්මෙ ඉපදුනාට පස්සේ අර කිසිවක් මතක නෑ. ඒ අමතක වීම නිසා මනුෂ්‍යයො බොහෝම පිරිහෙනවා. පාප මිත්‍ර සේවනයට වැටෙනවා. නැවත පව්කම් කරනවා. නැවත නැවත පරිහානියට පත් වෙලා සතර අපායට වැටෙනවා. එහිදී කුසල් කරගන්නට ඉඩක් නැතිව, ධර්ම ශ්‍රවණයට ඉඩක් නැතිව, කළ්‍යාණ මිත්‍ර සේවනයක් නැතිව තවත් පිරිහෙනවා. අගාධයට වැටිලා නැවත කල්ප දහස් ගණනකින් තමයි අහඹු ලෙස පින මතුවෙලා ආයෙ පාරමී පුරන්නට හැකි වෙන්නෙ. නැවතත් ඒවා මතක නැතිව ආයෙත් පිරිහෙනවා. මේ විපත නිසා තමයි පෘථග්ජනයන්ගේ සසර ගමන බොහෝ දීර්ඝ වෙන්නෙ.

බුදුහාමුදුරුවො එක්තරා අවස්ථාවක ආනන්ද හාමුදුරුවො සමග චාරිකාවෙ වඩිද්දී කඩි රැලක් පෙන්නල අහනවා, ''ආනන්ද මේ කඩි රැළේ කොච්චර කඩි ඇතිද'' කියලා. ආනන්ද හාමුදුරුවො කියනවා ''ස්වාමීනි ගණන් කරන්න බැරි තරම් ඉන්නවා'' බුදුහාමුදුරුවො දේශනා කරනවා, ''ආනන්ද මේ කඩි රැළේ එකම කඩියෙක් වත්

නැහැ අතීතයේ සක්විති රජ නොවුණු කෙනෙක්. මම මුලින් කිව්වනෙ සක්විති රජෙක් කියන්නේ මොන තරම් මහ කුසල් කරලා පහල වෙන ශ්‍රේෂ්ඨ පුද්ගලයෙක්ද කියලා. එවන් පුරුෂයෝ පවා කලෙකදි අගාධයට ඇද වැටෙනවා. මේ පෘථග්ජන ස්වභාවය තුළ ගුණය තහවුරු වෙන්නෙ නෑ. වහා පිරිහෙනවා. වහා කෙලෙසෙනවා. නමුත් මෙසේ ධාතු ගර්භයන් සකසලා ඒ තුළ සුරක්ෂිතව ධාතූන් තැන්පත් කළා වූ, වැඳුම් පිදුම් කළා වූ මනුෂ්‍යයෝ ඒ කුසල ශක්තිය නිසා නොපිරිහෙන්නා වූ ගුණයෙන් යුක්ත වෙනවා. මේ ජීවිතයේ යම් ශ්‍රද්ධාවක් පුහුණු කළා ද, යම් ශීලයක් පුහුණු කළා ද, යම් සමාධියක් යම් ප්‍රඥාවක් දියුණු කළා ද, ඒ ශ්‍රද්ධා, ශීල, ත්‍යාග, ප්‍රඥා ආදී ශ්‍රේෂ්ඨ ගුණයන් මතු මතු භවයන් හිදී කුඩා වයසේදීම මතුවී එනවා. තමන්ගේ යහපත් ප්‍රාර්ථනාවන් සිහි වෙනවා.

ඒ සිහිපත් වීම නිසා කළ්‍යාණ මිත්‍ර ඇසුර තුළින් ධර්ම ශ්‍රවණය තුළින් මතු භවයේදි ගුණධර්ම තවත් තහවුරු කර ගන්නවා. ඉන් මතු භවයෙ තවත් තහවුරු කර ගන්නවා. යම් සේ මේ චෛත්‍ය රාජයාණන් වහන්සේ වසර සිය ගණනක් දහස් ගණනක් නොසැලී නොකැඩී පවතිනවාද, ඒ හා සමානව දායක පින්වතුන්ගේ ශ්‍රද්ධා ශීල සමාධි ප්‍රඥා ආදි ගුණ තහවුරු වෙනවා. ඉතා ඉක්මනින් නිර්වාණය අවබෝධ කරනවා.

## චෛත්‍යයේ කොත

ඒ වගේම චෛත්‍යයට කොතක් පළඳවනවා. ''කොත'' කියන්නෙ හරියට රජෙකුගේ හිසේ පළඳන ඔටුන්නක් වගෙයි. ඔටුන්න නැතිනම් රජතුමාගෙ බැබලීමක් නෑ. කොත නැතිනම් චෛත්‍යයේ බැබලීමක් නෑ. චෛත්‍යය දස දිග්



භාගයේ බබලනවා මේ කොත් කැරැල්ල නිසා.

ඒ වගේම ඉතා දුරට චෛත්‍යය නොපෙනුණත් කොත් කැරැල්ල පේනවා. එහි ආලෝකය දසත පැතිරෙනවා. ඒ හා සමානව චෛත්‍යය ඉදිකරන්නා වූ මනුෂ්‍යයින්ගේ කීර්ති රාවය උපනුපන් සියළු භවයන්හි දස දිග් භාගයේම පැතිරෙනවා. ඔහුගේ යසස, කීර්තිය දසත පැතිරෙනවා.

කොත් කැරැල්ල නිසා චෛත්‍ය රාජයාණන් වහන්සේ අභිමානවත්ව බැබලෙන්නා හා සමානව ඊට දායක වූ පින්වතුන් දෙව්ලොව උපන්නත් මනුලොව උපන්නත් යසසින් කීර්තියෙන් බලයෙන් සවියෙන් රූප ශෝභාවෙන් මහේශාක්‍ය බවින් සියළු කල්හි අන්‍ය දෙව් මිනිසුන් අභිබවා බැබලෙනවා.

## චෛත්‍ය මළුව

ඒ වගේම චෛත්‍ය රාජයාණන් වහන්සේට සලපතල මළුවක් හෝ වැලි මළුවක් අපි ඉදි කරනවා. සලපතල මළුවයි කියන්නෙ ගල් අතුරා කරන මළුවයි. වැලි මළුව කියන්නේ වැලි අතුරා කරන මළුවයි. චෛත්‍ය රාජයාණන් වහන්සේගේ ආරක්ෂාව මෙයින් තහවුරු වෙනවා. ඒ වගේම චෛත්‍යට දර්ශනීය බවකුත් ගම්භීරත්වයකුත් ලැබෙනවා. ඒ හා සමානව ඒ දායක පින්වතුන්ට, ඒ කර්මාන්තයට සම්බන්ධ වූ සියළු දෙනාටම හාත්පසින් පැමිණෙන උපද්‍රවයන්ගෙන් ජීවිතය ආරක්ෂා කරගෙන, මනස ආරක්ෂා කරගෙන, මහේශාක්‍ය ආත්මභාව ලබමින් සියළු දෙව් මිනිසුන්ට ප්‍රියමනාපව විරාජමාන වෙන්නට ඒ කුශලය හේතු වෙනවා.

ඒ වගේම දස දිගින් මහා සුළි සුළං කුණාටු හැමුවත් චෛත්‍යයක් කිසිදාක සොලවන්නට බැහැ. ඒ හා සමව මේ චෛත්‍යය ඉදිකිරීමේ කුසලයට සහසම්බන්ධ වූ, අනුමෝදන් වූ සියළුම දෙනා, තමන් වෙත පැමිණෙන දුක සැප සියල්ල සමසේ විඳ දරාගෙන නොසැලෙන්නාවූ මනසකින් නිවන් මගෙහි නොපසුබටව ඉදිරියට පියමන් කරන්නට තරම්

සවියක් බලයක් ආධ්‍යාත්මික ශක්තියක් ලබනවා.

චෛත්‍යයක සර්වඥ ධාතූන් වහන්සේ තැන්පත් කරලා එයට පරිවාර වශයෙන් සිය ගණනක් කරඬු තැන්පත් කරනවා. එහි අනුසස් වශයෙන් දෙව්ලොව උපන්නත් මනුලොව උපන්නත් සියළු භවයන්හිදී තමන්ගේ සියළු කටයුතු ඉතා පහසු කර ගන්නට පරිවාර සම්පත්තිය නොඅඩුව ලැබෙනවා.

## මානසික ශක්තිය රැකගන්න !

මෙහෙම අනුසස් අහන කොට ඇතැම් කෙනෙකුට හිතෙන්න පුළුවන් ''මේ ටික කලින් දන්නවා නම් අපිත් මේකට දායක වෙනවා, අපට බැරි වුණානෙ කරඬුවක්වත් තැන්පත් කරන්න, අපිට බැරිවුණානෙ ගර්භයට එක ගඩොල් කැටයක් වත් දෙන්න, මේ ටික කල් ඇතිව දැන ගෙන හිටියා නම් තව මීට වඩා ශක්තිමත්ව මේ කුශලය කරන්නට තිබුණානෙ'' කියලා සිතුවිලි පහළ වෙන්න පුළුවන්.

එසේ නොසිතිය යුතුයි. චෛත්‍යයේ සවිමත් බවේ තරමට කුසලය සවිමත් වෙනවා වගේම කුසල් සිත දූෂ්‍ය වූ තරමට කුසලය හීන වෙනවා කියන බවත් තේරුම් ගන්නට ඕන. පින් පව් සිද්ධ වෙන්නේ මනසේ මිස වැලි ගඩොල් තුළ නෙවෙයි. වැලි, ගඩොල්, සිමෙන්ති ආදී දේ අපේ කුසලය සවිමත් කරගන්න අපට උදව් කර ගන්න පුළුවන්. නමුත් එය නොවෙයි කුසලය. අපේ මනසේ සවියයි කුසලය. ඒ නිසා යමෙක් පසු තැවුණොත්, යමෙක් මනස කිළිටි කරගත්තොත් තමන් මෙතෙක් කරගත්තා වූ කුසලයත් දුබල වෙනවා.

ඒ නිසා පූර්ණ වූ සවිමත් වූ කුසලයක් කරගන්නට නම් මූලික සවිය තිබිය යුත්තේ චෛත්‍යයේ නොවෙයි තමන්ගේම මනස තුළයි. චෛත්‍යයේ සවිය ඊට උදව් වෙනවා. නමුත් චෛත්‍යයේ සවිය නැතත් මනසේ සවිය තියෙනවා නම් කුසලය සවිමත් වෙනවා. එයට හොඳම උදාහරණයක්



ආපදාන පාළියේ දැක්වෙන පුලින ථූපිය මහ තෙරුන් වහන්සේගේ කථාව.

## පුලිනථූපිය තෙරුන් වහන්සේ

''පුලින'' කියන්නේ වැලි වලට. ''ථූප'' කියලා කියන්නේ චෛත්‍යයට. වැලි වලින් චෛත්‍යයක් හදලා ඒ වැලි චෛත්‍යයට වැඳුම් පිදුම් කළ කුසලය නිසා අනන්ත සංසාරයේ මහා සැප සම්පත් භුක්ති විඳලා අවසාන භවයේ සකල ක්ලේශයන් ප්‍රහීන කරලා අර්හත් ඵලය සාක්ෂාත් කරන්න තරම් සවිය ලැබූ නිසා ඒ මහ රහතන් වහන්සේ එනමින් හැඳින්වූවා. ඒ පුලින ථූපිය මහ තෙරුන් වහන්සේ හත් අවුරුදු වයසේදි ගිහි ගෙයි කුඩා දරුවෙක් කාලයේ දීම අර්හත්වයට පත් වුනා.

පසු කලෙක පැවිදිවෙලා පූර්වේ නිවාසානුස්මෘති ඥානයෙන්, ඒ කියන්නෙ පෙර ජාති පිළිබඳව දක්නා නුවණින් තමන් වහන්සේගේ පෙර අත් භව පිළිබඳව ආවර්ජනා කළා. එසේ ආවර්ජනා කරලා, තමන් වහන්සේ දෝතින් වැලි අරගෙන හැදූ චෛත්‍යයකට වැඳුම් පිදුම් කරලා ඒ කුශලයෙන් අනන්ත සසරේ ලැබූ විපාක හෙළි කළා.

උන්වහන්සේ සඳහන් කරනවා ''මීට කල්ප බොහෝ ගණනකට පෙර හිමාලය ආසන්නයේ ''යමක'' කියලා මහා කන්දක් තිබුණා. ඒ කන්දෙ මට නිර්මාණය කරපු සුවිශාල පන්සලක් තිබුණා. මම ඒ පන්සලේ උග්‍ර ලෙස තපස් රැක්කා. එදා මගේ නම ''නාරදයි.'' දාහතර දාහක් ශිෂ්‍යයෝ මම පිරිවරාගෙන මගෙන් වේද වේදාන්තයන් හදාරනවා. මගෙන් බණ දහම් ඉගෙන ගන්නවා. කමටහන් ඉගෙන ගන්නවා. බවුන් වඩනවා. සමාධිය වඩනවා. ධ්‍යාන වඩනවා. කලක් මෙසේ කටයුතු කරද්දී මට මෙහෙම සිතුවිල්ලක් පහළ වුණා.

මේ ලෝකයේ බොහෝ දෙනෙක් මට වැඳුම් පිදුම් කරනවා. බොහෝ දෙනෙක් මම ඇසුරු කොට ජීවත් වෙනවා. මටත් වැඳුම් පිදුම් කරන්න මට වඩා ගුණවතෙක් සිටියානම් කොයි තරම් වටිනවද? මම කොහොමද මේ මහ වනයේ මට වඩා ගුණවතෙක් හොයා ගන්නේ. එබඳු කෙනෙක් මට හොයා ගන්න නොහැකි වුණා. නමුත් මම අහලා තිබුණා - දෙතිස් මහා පුරුෂ ලක්‍ෂණයෙන් හෙබියා වූ මහා ප්‍රඥවෙන් සියල්ල අවබෝධ කර ගත්තා වූ සකල ක්ලේශයන් ප්‍රහීණ කළා වූ සම්මා සම්බුදුවරු කලින් කලට මේ ලෝකයේ පහල වෙනවාය කියලා මම වේද වේදාන්තයන් තුළින් දැන ඉගෙන ගෙන තිබුණා. මගේ අසපුව අසලින් ගලාගෙන යන ලස්සන ගංගාවක් තියෙනවා ''අමරික'' කියලා. මම ඒ පිරිසිදු ජල ධාරාවෙන් හා සුදෝ සුදු වැලිවලින් පිරුණු නදිය ළඟට ගිහිල්ලා වැලි එකතු කරලා චෛත්‍යයක් වගේ ගොඩ ගැසුවා. එහෙම ගොඩ ගහලා මම කල්පනා කළා, මේ ලෝකයේ යම් මහා පුරුෂයෙක් අනන්ත සීල සමාධි ප්‍රඥවෙන් හා අනන්ත කරුණා මෛත්‍රියෙන් යුක්තව, සියළු සත්වයන් කෙරෙහි කරුණාවෙන්ම අපමණ සසරෙහි පාරමී පුරා සකල ක්ලේශයන් ප්‍රහීන කොට, සියල්ල තම නුවණින් මැනවින් දැන සම්මා සම්බුද්ධත්‍වයට පැමිණියේ නම්, මේ වැලි චෛත්‍යය ඒ බුදුවරයන් වහන්සේගේ අනන්ත ගුණය උදෙසායි. ඒ තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේ ගේ ශාරීරික ධාතූන් වහන්සේලා මෙහි නිදන් කළා හා සමානව උන් වහන්සේ වෙනුවෙන්මයි මම මේ වැලි චෛත්‍යය සකසන්නෙ.

එහෙම හිතලා මම මගේ දෝතින් වැලි චෛත්‍යයක් හැදුවා. ඍධියෙන් රත්‍රන් මවලා, ඒ රත්‍රන් වලින් අලංකාර මල් තුන් දහසක් නිර්මාණය කරලා මම ඒ චෛත්‍යයට පූජා කළා. චෛත්‍යයට මම උදේ සවස ගෞරවයෙන්



වැඳ නමස්කාර කළා. ඒ අන් කිසිවක් සඳහා නෙවෙයි, මට වඩා ගුණ ඇති මට වඩා සිල් ඇති මට වඩා සමාධි ඇති මට වඩා නුවණ ඇති, ලෝකයේ සත්වයින් කෙරෙහි මට වඩා කරුණාව මෙත් සිත ඇති ඒ තථාගතයන් වහන්සේගේ අනන්ත ගුණය සිහි කර කර උදේ හවස මම වැඳුම් පිදුම් කළා. මම නමස්කාර කළා. උදේ හවස වැලි චෛත්‍යය අබියස අතුපතු ගාලා වත් පිළිවෙත් කළා. මෙසේ කටයුතු කරන අතරතුර යම් දිනෙක මගේ මනසේ රාග සිතුවිල්ලක් හෝ ද්වේශ සිතුවිල්ලක් හෝ ඊර්ෂ්‍යා ගුණමකු බව ආදී පාපකරී සිතුවිල්ලක් හෝ පහළ වුණා නම්, මම මෙහෙම හිතුවා,

## කෙළෙස් වලට ඉඩක් නැහැ

''මහා ගුණ ඇති මහා ප්‍රඥාව ඇති සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ අනන්ත ගුණය නිරන්තරයෙන් සිතින් සිහි කරමින් වැඳුම් පිදුම් කරමින් බුදු ගුණ සමගයි ඔබ ජීවත් වෙන්නෙ. ඒ නිසා ඔබගේ සන්තානය තුළ තථාගතයන් වහන්සේ නිරන්තරයෙන් වැඩ ඉන්නවා හා සමානයි. ඒ තථාගතයන් වහන්සේ වැඩ සිටින ඔබේ සිත තුළ මෙවන් කාමාදී විතර්කයන් පහළවීම කෙසේවත් යෝග්‍ය නෑ.''

මම මෙසේ මටම අවවාද කළා. වැලි චෛත්‍යය සිහිකරමින් ඒ තථාගතයන් වහන්සේගේ අනන්ත ගුණ සිහි කරන්නා වූ මගේ සිතේ පහළ වූ රාගය, ද්වේශය සැනෙකින් දුරුවෙලා ගියා. මගේ මනස වහා සමාධි ගතවුණා. මේ ආකාරයට මම එදා තථාගතයන් වහන්සේ ගේ ගුණ සිහි කරමින්, සන්තානයේ ක්ලේශයන් මැඩ පවත්වමින් ධ්‍යාන වැඩුවා.'' මේ විදිහට ඒ පුලින ථූපිය මහ තෙරුන් වහන්සේ තම අතීත ආත්ම භාවය පිළිබඳව කරුණු පැහැදිලි කළා. ඒ කතාව මදකට නවත්වලා මෙහිදී යම් කරුණක් පැහැදිලි කළ යුතුයි.

## සැපය බලාගෙන කරන පිංකම දුබලයි

නාරද තාපසතුමා ඒ චෛත්‍යය නිර්මාණය කළේ කුමන අරමුණක් ඇතිවද? කුශල් කිරීමෙන් සැප විපාක ලැබෙන බව අහන සමහර අය අද කාලෙ කුශල් කරන්නෙ ඒ සම්පත් ලබන්න. තමන්ටත් කීර්තිය ලබන්නට, සුවය ලබන්නට. නමුත් මේ නාරද තාපසතුමා චෛත්‍යය ඉදි කළේ තමන්ට කීර්තිය ලබන්න වත් බලය ලබන්න වත් පිරිවර ලබන්න වත් නුවණ ලබන්න වත් නෙවෙයි. එහෙනම් කුමක් සඳහාද? මට වඩා ගුණවත් මට වඩා සිල්වත් මට වඩා සමාධිය ඇති මට වඩා ප්‍රඥාව ඇති මට වඩා කරුණාව මෛත්‍රිය ඇති යම් උතුමෙක් පහල වුණා නම්, උන්වහන්සේගේ අනන්ත ප්‍රඥාවට, අනන්ත ගුණයට මම වඳිනවා කියන උසස් හැඟීම ඇතිවයි.

එහෙම නම් එතුමා වැලිගොඩට වැන්දේ ගුණයට ගරු කරන්නයි, සම්පත් ලබන්නට නෙමෙයි. අද වැඩි දෙනා සම්පත් ලැබීමේ තෘෂ්ණාවෙන් කුසල් කරනවා. තෘෂ්ණාව කියන්නෙ අකුසලයක්. එයින්ම හිත දූෂ්‍ය කරගෙන කුශලයෙන් පිරිහෙනවා. සම්පත් ලැබෙන්න නම් කුශලය මැනවින් සිදු කරන්න ඕන. කුසලය සිද්ධ වෙන්නෙ සිත පවිත්‍ර වූවොත් පමණයි. සිත පවිත්‍ර වෙන්නෙ යහපත් චේතනාවක් මතු වුනොත් පමණයි. ගුණය යට ගිහිල්ලා සම්පත් තෘෂ්ණාව මතු වූ සැනින්, ඒ කිලිටි චේතනාවෙන් මනස කෙළෙසෙනවා. මනස කෙළෙසීම - දූෂ්‍ය වීම අකුශලය හෙවත් පාපය නම්නුයි හඳුන්වන්නෙ. පාප ධර්මය හට ගන්නා තැන එහි විපාකය ලෙස දුක හට ගන්නවා විනා කවදාවත් සැපය හට ගන්නෙ නැහැ.

ඒ නිසා අපි චෛත්‍යය වැඳිය යුත්තේ, බෝධිය වැඳිය යුත්තේ, බුදුන් වැඳිය යුත්තේ කුමක් අරමුණු කරගෙනද? මගේ අපලය දුරු වෙන්නට වත්, මගේ කිතුගොස වැඩෙන්නට වත්, බලය ලබන්නට වත්, දෙව් මිනිස් සැප විඳින්නට වත් කියන තෘෂ්ණාවෙන් නෙවෙයි. තථාගතයන් වහන්සේ



මහා ප්‍රාඥයි, අනන්ත ගුණයෙන් යුක්තයි, ඒ ගුණය සදා වන්දනීයයි. ඒ ගුණයට ගරු කිරීමෙන් තමන් තුළත් ගුණ වැඩෙනවා. බුදුරජාණන් වහන්සේගේ ගුණයට වඳිනවා කියන සිතුවිල්ලෙන් බෝධිය අභියස හෝ චෛත්‍යය අභියස හෝ බුදු පිළිමය අභියස හෝ වඳිනවා නම් සියළු කල්හි බුදුන් වැන්දා වෙනවා. චෛත්‍යය වැන්දා වෙනවා. බෝධිය වැන්දා වෙනවා. එසේ නැතිව මේකෙන් මට සම්පත් ලැබෙනවා, මේ තුළින් මට කීර්තිය ලැබෙනවා, බලය ලැබෙනවා, ධනය ලැබෙනවා, කියලා තෘෂ්ණාවෙන් වඳිනවා නම් ඒ තැනැත්තා වඳින්නෙ බෝධිය නෙමෙයි, තෘෂ්ණාවයි. ඒ වඳින්නේ චෛත්‍යයට නෙමෙයි, සම්පතටයි. ඒ වඳින්නේ බුදුහාමුදුරුවන්ට නෙමෙයි, තමන්ගේ අනාගත ප්‍රාර්ථනාවටයි. එසේ වඳින්නා වූ මනුෂ්‍යයා තෘෂ්ණාවෙන් සසර අතරමං වෙනවා විනා යහපත දකින්නේ නැහැ. ගුණවත් වෙන්නේ නැහැ. ගුණය නොවැඩෙද්දී මනස වැඩෙන්නෙ නැහැ. මනස නොවැඩෙද්දී මනුෂ්‍ය වෙන්නේ නැහැ. මනුෂ්‍ය නොවෙද්දී බෞද්ධ වෙන්නෙ නැහැ. බෞද්ධ නොවෙද්දී නිවන් දකින්නෙ නැහැ.

ඒ නිසා එසේ තෘෂ්ණාවෙන් කුසල් කරන්නා වූ මනුෂ්‍යයො බෞද්ධ කමින් හෙවත් ප්‍රඥාවෙන් පිරිහෙනවා. මනුෂ්‍ය කමින් හෙවත් ගුණයෙන් පිරිහෙනවා. කුශලයෙන් හෙවත් පවිත්‍රත්වයෙන් පිරිහෙනවා. පාප ධර්මයෙන් තෘෂ්ණාවෙන් මනස කෙළෙසා ගෙන අනන්ත සසරෙ දුක් විපාක දැතින් බදාගෙන නැවත නැවත ඉපදෙනවා. යහපත දකින්නට ඕනෑ නම්, සුවපත්ව සසර ගමන් කරන්නට ඕනෑ නම්, දහම ප්‍රත්‍යක්ෂ කරන්නට ඕනෑ නම්, ප්‍රඥාව ලබන්නට ඕනෑ නම්, ඒ සියල්ල සඳහා ගුණය ගුණය හැටියට, කුශලය කුශලය හැටියට හඳුනාගෙන මැනවින් කුශල් දහම් වැඩිය යුතුයි.

## කුසලය - පින

කුශලය කියන කොටම අපිට සම්පතමයි මතක් වෙන්නෙ. නමුත් කුශලය කියන්නෙ භෞතික සම්පත් නෙවෙයි. චිත්ත පාරිශුද්ධියයි. ඒ කුශලයේ විපාක වශයෙන් පසු කලෙක භෞතික සම්පත් ලැබෙනවා. එය හේතු ඵල නියමයයි. නමුත් ඒ විපාකය ගැන තෘෂ්ණාව ඇති කර ගත්තොත් ලැබෙන්නේ දුක පමණයි. බුදුහාමුදුරුවො කුශලය කොහොමද හැඳින්වූයේ? දහම් පොතපතේ කුශලය හඳුන්වන්නේ මෙහෙමයි - මනස දූෂ්‍ය කරන්නා වූ මනස අඳුරු කරන්නා වූ මනස කිලිටි කරන්නා වූ පාප ධර්මයන් සොලවලා කම්පා කරලා බිඳලා විනාශ කරලා මනසේ පවිත්‍රත්වය ඇති කරන යම් චිත්ත ශක්තියක් වෙත්ද, එය කුශලයයි.

එහෙමනම් ''කුශලය'' කියන්නෙ අන් කිසිවක් නෙවෙයි, පිරිසිදු මනෝභාවයයි. ''පින'' කියන්නෙ කුමක්ද? "චිත්තං පුණාතීති පුඤ්ඤං" මෙහි සිංහල අර්ථ විග්‍රහය වරදවලා කියනවා ''සිතේ පිනායාම පිනයි'' කියලා. එහෙමනම් මනුෂ්‍යයො කොතරම් පින් කරගනීද? සතුන් මරලත් මිනිස්සු සිත පිනවනවා, සොරකම් කරලා, කාමයෙහි වරදවා හැසිරිලාත් සිත පිනවනවා. තමන් කැමති දේ දූකලා අහලා රස විඳලා සිත පිනවනවා. එහෙමනම් මේ සියල්ලක්ම පින් වෙන්නට ඕනෑ. මේ වරදවා කරන වචන විග්‍රහය අද සමහර උගතුන් පවා අවිචාරයෙන් සඳහන් කරනවා. නමුත් එහි සැබෑ අර්ථය මොකක්ද? ශබ්ද කෝෂයේ දක්වනවා "පුණාති" කියන්නෙ පිරිසිදු කරනවා. එහෙම නම් පිනයි කියන්නෙ සිතේ පිරිසිදු බව හෙවත් පවිත්‍රත්වයයි. එහෙනම් කුසලය කියන්නෙත් පින කියන්නෙත් එකම අර්ථය ඇති වචන දෙකක්.

නමුත් මතක තියාගන්න, තෘෂ්ණාව ඇති වූ තැන නම් කවදාවත් සිතේ පවිත්‍රත්වයක් ඇතිවෙන්නේ නැහැ. ඒ නිසා



කුසල් කරනවාය යන හැඟීමෙන් හෝ තෘෂ්ණාව වැඩුවොත් අනර්ථයක්මයි.

දැන් අපි මෙතෙක් කියාගෙන ආ කථාවෙ පුලින ථූපිය මහ තෙරුන් වහන්සේ, තමන් වහන්සේගේ චරිතාපදානය තවදුරටත් මෙසේ සඳහන් කරනවා, ''මම එදා මේ ආකාරයට වැලි ගොඩක් ගොඩ ගහලා තථාගතයන් වහන්සේගේ අනන්ත ගුණ සිහි කරමින් වැන්දා. මගේ සිතේ ක්ලේශයක් මතුවුණ හැම මොහොතේම මම මට අවවාද කරගත්තා - මම තථාගතයන් වහන්සේටයි පුදන්නේ. තථාගතයන් වහන්සෙගේ ගුණ සිහි කරන්නා වූ සිතින්ම අකුශල පාප ධර්මයන් මා වෙත කැඳවා නොගත යුතුයි. ඒ නිසා තථාගතයන් වහන්සේ යම්සේ ක්ලේශයන් ප්‍රහාණය කළාද, මගේ සන්තානය තුළත් මතු වී එන ක්ලේශයන් ප්‍රහාණය කළ යුතුයි කියලා සිතට අරගෙන මම කෙලෙස් මැඩ පවත්වමින් ධ්‍යාන වැඩුවා. මෙසේ කාලය ගතවෙද්දී ආයු කෙළවර මම අභාවයට පත්වුණා.

## චෛත්‍ය ඉදිකිරීමේ අනුසස්

මා වැඩූ ධ්‍යානය නිසා බඹ ලොව බොහෝ දීර්ඝායු ඇති මහා බ්‍රහ්ම රාජයෙක් බවට පත්වුනා. ඒ බ්‍රහ්ම ලෝකයේ ආයු ඇති තාක් බ්‍රහ්ම සම්පත් විඳලා මම නැවත දෙව්ලොවට පැමිණියා. දිව්‍ය ලෝකයේ අසූ වාරයක් මම සක්දෙව් රජකම ලැබුවා.

මනුෂ්‍ය ලෝකයේ උපන් වාරවල තුන්සිය වතාවක් චක්‍රවර්ති රාජ්‍යය ලැබුවා. චක්‍රවර්ති රජ කෙනෙක් පහළ වෙන්නේ කල්ප කාලාන්තරයකින්. සාමාන්‍ය කෙනෙක් නෙවෙයි. වැඩූ කුශල බලයෙනුත් ඒ වගේම දස රාජ ධර්මයෙන් රාජ්‍යය කළාවූ කුශල බලයෙනුත් ලැබෙන උත්තම

පදවියක් තමයි චක්‍රවර්ති රජකම.

මේ සක්විති රාජ්‍යය මම තුන්සිය වාරයක්ම ලැබුවා. ඒ වගේම මම මනුෂ්‍ය ලෝකෙ ඉපදුණු කාලවල ප්‍රදේශ රාජ්‍ය ලැබූ වාර අපමණයි. මම යම් කලෙක මනුෂ්‍ය ලෝකයේ ඉපදුනා නම්, මාව පෝෂණය කරන්න මාව රැකබලා ගන්න ලක්ෂයක් කිරි මව්වරු හිටියා. මේ මහා සම්පත් මම ලැබුවේ කුමන ශක්තියකින්ද? එදා වැලි ගොඩ සකසලා තථාගත සම්මා සම්බුදු රජාණන් වහන්සේගේ ගුණයට නමස්කාර කළාවූ, පුලින චෛත්‍යයක් හදලා පිදුවාවූ මහා කුශලය නිසයි. ඒ වගේම මම යම් කලෙක දෙව් ලොව ඉපදුනා නම්, තේජසින් යසසින් බලයෙන් සවියෙන් ආඪ්‍ය වුණා. මම මනුලොව යම් කලෙක ඉපදුනා නම්, කීර්තියෙන් බලයෙන් ධනයෙන් රූප ශෝභාවෙන් හා ප්‍රභාවෙන් යුක්ත වුණා. මගේ ශරීරයේ කිළුටු තැවරෙන්නෙ නෑ. ඩහදිය වැගිරෙන්නෙ නෑ. ඒ චෛත්‍යයට වත් පිළිවෙත් කිරීමේ ආනිසංසයයි.

මනසේ ශක්තිය, මනසේ පිරිසිදු බව යම් යම් තරමට ඇති කරගෙන චෛත්‍යය පුදනවාද ඒ ඒ තරමට චෛත්‍යය පිදීමේ කුශලය උසස් වෙනවා. බලවත් වෙනවා. ඒ නිසා කිසිම කෙනෙකු පසු තැවෙන්න එපා, මහා කුශලයකට දායක වුණාය කියලා එහි වටිනාකම ගැන හිතලා හිත පහදවා ගන්න. දායක වෙන්න නොහැකි වූ අයට ඒ කුශලය සතුටු සිතින් අනුමෝදන් වෙලා නැවත එබඳු පිංකමක් කරන අවස්ථාවක ඊට දායක වෙන්න අධිෂ්ඨාන කර ගන්න පුළුවන්.

වැලි ගොඩක් ගහල බුදු ගුණ සිහි කරලා වැඳීමෙන් එතරම් කාලාන්තරයක් සැප විපාක ගෙන දුන්නා නම්, මේ වගේ අවුරුදු සිය ගණනක් දහස් ගණනක් සියළු දෙව් මිනිසුන්ගේ වන්දනා මාන වලට පාත්‍රවන මහා චෛත්‍යයක් ඉදි කිරීමේ කුශල විපාකය ප්‍රමාණ කළ නොහැකි තරම්.



ඒ පුලින ථූපිය තෙරුන් වහන්සේ තමන් වහන්සේගේ වර්තමාන ආත්මය ගැනත් සඳහන් කරනවා "මම මේ ආකාරයෙන් සසර සැරිසරා මේ භවයෙ සැවැත් නුවර එක්තරා කුල ගෙයක ඉපදුනා. මගෙ අම්මා තාත්තා ශ්‍රද්ධාවන්තයි. බුදුන් දහම් සඟුන් සරණ ගිය අය. මගෙ අම්මා තාත්තා ගේ ශ්‍රද්ධාව කොපමණද කියනවා නම්, ඒ අය බුදුහාමුදුරුවො බුදු වූ බෝධිය ළඟට ගිහිල්ලා බෝධියෙ දිරාපත්ව හැළුණු බෝ පොතු ටිකක් අහුලගෙන ඇවිත්, රත්තරනින් කරඬුවක් හදලා එහි තැන්පත් කළා. මේ බෝ පොතු ටික තැන්පත් කළ රත්තරන් කරඬුව ලඟ උදේ හවස තථාගතයන් වහන්සේගේ ගුණ සිහිකරලා වඳිනවා.

දවසක් පසලොස්වක පොහෝ දවසක අම්මයි තාත්තයි මේ කරඬුව එළියට අරගෙන වත් පිළිවෙත් කරලා රාත්‍රිය මුළුල්ලේම බුදුගුණ සිහිකරන්නට පටන් ගත්තා. එදා මේ රන් කරඬුව දැකලා මට අතීත භවය සිහිවුණා. මම පෙර නාරද නැමැති තාපසයෙක් වෙලා අමරික කියන නදිය අසබඩ දෝතින් වැලි එකතු කරලා වැලි චෛත්‍යයක් හදලා තථාගතයන් වහන්සේගේ ගුණ සිහි කර වැන්ද අයුරු මට සිහි වුණා. බුදුගුණ සිහි වුණා. බුදුගුණ සිහිවෙන කොටම මනස සන්සුන් වෙලා කෙලෙස් ප්‍රහීන වුණා. සකල ක්ලේශයන් ප්‍රහීන කරලා මම එදා ඒ මොහොතේම අර්හත්වයට පැමිණුනා.

එසේ හත් අවුරුදු වයසේදීම අර්හත්වයට පත් වූ මම, ඒ තරම් මා හැඟි ගුණ ඇති සම්මා සම්බුදු රජාණන් වහන්සේ කොහේ වැඩ වෙසේදෝයි සොයා ගෙන ගියා. මට මහා ප්‍රාඥ වූ සැරියුත් මහ රහතන් වහන්සේ මුණ ගැසුණා. මම උන් වහන්සේ අභියස, උන් වහන්සේගේ ගෝලයෙකු හැටියට පැවිදි වුණා. මේ බුද්ධ සාසනයේ මට තවත් කරන්න කිසිවක් නෑ. මම කෙලෙසුන් සියල්ල ප්‍රහීණ කළා. ෂඩ් අභිඥා ලැබුවා.

ත්‍රිවිද්‍යා ලැබුවා. ඒ වගේම සිව් පිළිසිඹියා ලැබුවා. දැන් මම තථාගතයන් වහන්සේ විසින් දෙසුවා වූ ලොව්තුරු සුවය විඳින බුද්ධ පුත්‍රයෙක්. මේ ලෞකික ලෝකෝත්තර සියළු සම්පත් මම ලැබුවේ, තථාගතයන් වහන්සේගේ අනන්ත ගුණය වෙනුවෙන් වැලි ගොඩකින් සෑය හදලා, ඒ වැලි චෛත්‍යයට පූජා කිරීමේ කුශලයෙන්'' කියලා උන්වහන්සේ දේශනා කළා.

## චෛත්‍ය ප්‍රතිසංස්කරණය

සිමෙන්ති හුණු බදාම ආදියෙන් ශක්තිමත්ව ඉදි කරන චෛත්‍යය තාවකාලික එකක් නොවන නිසා බොහෝ කල් පවතිනවා. නමුත් විටින් විට ප්‍රතිසංස්කරණය කරන්න සිදු වෙනවා. ප්‍රතිසංස්කරණය කිරීම, අභිනවයෙන් චෛත්‍යයක් ඉදි කරන තරම් දුෂ්කර කටයුත්තක් නෙවෙයි. නමුත් ඒ චෛත්‍ය පිළිසකර කිරීමේ කුශලය බොහොම ප්‍රබල විපාක ඇති කරන්න සමත් වෙනවා.

මෙයින් කල්ප අනූ හතරකට පෙර "සිද්ධාර්ථ" නම් තථාගතයන් වහන්සේගේ ධාතු නිදන් කොට ඉදිකර තිබුණු චෛත්‍යයක පැළී තිබුණු තැන් බදාම යොදලා පිළිසකර කළ සැදැහැවතෙක් ඒ පිනෙන් කල්ප අනූ හතරක් දෙව් මිනිස් සැප විඳ, අපගේ ගෞතම බුදුරජාණන් වහන්සේගේ සසුනෙහි පැවිදි වෙලා රහත් වුණා. බදාම පිඩක් යොදා කළ පිනෙන් එබඳු මහා සම්පත් ලද නිසා උන්වහන්සේ "සුධාපිණ්ඩිය" තෙරුන් නමින් ප්‍රකට වුණා.

ඒ වගේම ලංකාවෙ වසභ රජතුමාට, ජීවිතය විනාශ වෙන්න තරම් ප්‍රබල මාරකයක් ඇති බව පුරෝහිතයන් පැවසුවා. රජතුමා බුද්ධිමත් නිසා එයට කුමක් කළ යුතුද කියලා භික්ෂූන් වහන්සේලා ගෙන් විමසුවා. උන්වහන්සේලා



උපදෙස් දුන්නා අභාවයට යමින් පවතින වෙහෙර විහාරස්ථාන ප්‍රතිසංස්කරණය කරන්න. රජතුමා බොහෝම ගෞරවයෙන් ලංකාවෙ සෑම තැනම අභාවයට යමින් තිබුණු වෙහෙර විහාර පිළිසකර කළා. ඒ කුශලයෙන් රජතුමාගේ මාරකය වැළකිලා බොහෝ කාලයක් නිරුපද්‍රිතව ජීවත් වුණා.

මේ කරුණු වලින් අපට වටහා ගන්න පුළුවන් චෛත්‍ය ඉදිකිරීම පමණක් නොවෙයි, වතාවත් කිරීම, ප්‍රතිසංස්කරණය කිරීම තුළින් පවා මහා කුශල් රැස් වෙන බව. ඒවායේ විපාක මේ ජීවිතයේදීම අත් දකින්න පුළුවන්. ඒ වගේම ජීවිතය විනාශ කරන්නට තරම් ප්‍රබල පූර්ව අකුශල කර්ම පවා යටපත් කරන්න සමත් වෙනවා, බුදුගුණ සිහි කරගෙන චෛත්‍යයට වත් පිළිවෙත් කිරීමේ කුශලය. රෝග පීඩා දුරු කරන්නට මෙන්ම ප්‍රඥාව දියුණු වෙන්නට විශේෂයෙන් හේතු වෙනවා.

හොඳින් තීන්ත ආලේප කරලා අලංකාරව තිබෙන චෛත්‍යය පමණක් නෙවෙයි, ගරා වැටිලා වල් බිහිවෙලා තියෙන චෛත්‍යය වුණත් බුදු ගුණ සිහි කර සිත පහදවාගෙන වත් පිළිවෙත් කරන්න සුදුසුයි. ගඩොල් හුණු බදාම ආදිය දිරාපත් වුණත් බුද්ධ ගුණය කිසිදාක දිරාපත් වෙන්නේ නැහැ.

## චෛත්‍යයට වතාවත් කිරීම

මීට කල්ප ලක්ෂයකට පෙර පදුමුත්තර බුදුරජාණන් වහන්සේ වෙනුවෙන් ඉදි කළ චෛත්‍යයක් කාලයාගේ ඇවෑමෙන් වන ලැහැබක දිරාපත් වෙමින් වල් බිහිවෙලා තිබුණා. එක්තරා දැව කපන්නෙක් වනයෙහි ඇවිදගෙන යද්දී මේ වල් බිහි වුණු චෛත්‍යය දැකලා සැදැහැ සිතින් බුදු ගුණ සිහිකරමින් අකුල් කපා වල් පැළෑටි ඉවත් කරලා සෑයත් මළුවත් පිරිසිදු කරලා අට තැනක හිඳ චෛත්‍යය වැඳලා නික්ම ගියා. පසු කලෙක ඔහු මරණයට පත්වෙලා තව්තිසා

දෙව්ලොව උපන්නා. චෛත්‍යය පිරිසිදු කිරීමේ පිනෙන් ඔහුට සැට යොදුනක් උස තිස් යොදුනක් පළල රන් විමනක් පහල වුණා. ඒ තැනැත්තා එම කුශලයෙන් කල්ප ලක්ෂයක් දෙව් මිනිස් දෙගතියේ සැප විඳ, මේ ගෞතම බුදු සසුනේ පැවිදි වෙලා මහ රහතන් වහන්සේ නමක් වුණා. උන්වහන්සේ " පහංකර" තෙරුන් වහන්සේ නමින් ප්‍රකට වුණා.

ඒ පහංකර මහ රහතන් වහන්සේ තමන් චෛත්‍ය ස්ථානය ශුද්ධ පවිත්‍ර කිරීමේ කුශලයෙන් කල්ප ලක්ෂයක් මුළුල්ලේ ලැබූ සැප විපාක මෙසේ සඳහන් කළා.

"මම එතැන් පටන් දෙව් මිනිස් දෙගතියේ පමණක් උපන්නෙමි. අන්‍ය පහත් ගතියක නූපන්නෙමි. මනුලොව උපන් කල්හි මම රන්වන් ශරීර ඇත්තෙක් වීමි. ප්‍රභාමත් වීමි. මගේ ශරීරයේ දද, කුෂ්ඨ, ගඬු, සුදු කබර, අපස්මාර, අතුල් පතුල් පැලීම, කැසීම් ආදී රෝග ඇති නොවීය. මගේ සිරුරේ කැලැල් හට නොගත්තේය. මා අප්‍රිය කරන අමනාප දේ මගෙන් බැහැර වෙයි. මා ප්‍රිය කරන දේ පමණක් මා වෙත ලැබෙයි. මගේ සිත වහා එකඟ වෙයි. මැනවින් සන්සිඳෙයි. පිරිසිදු වෙයි. මම මේ ජීවිතයේ භාවනා කිරීමට වාඩි වූ පළමු වාරයේදීම සියළු කෙලෙසුන් නසා අර්හත්වයට පැමිණියෙමි."

මෙබඳු ආනිසංස අසන විට "අපටත් එබඳු දේ ලබන්නට නම් ඒ කුශලය කළ යුතුය" යි තෘෂ්ණාවෙන් නොගෙන, සිත පහදවාගෙන බුදු ගුණ සිහි කරමින් චෛත්‍යයට වත් පිළිවෙත් කළ හැකි නම් කාට වුවත් මෙබඳු සැප විපාක ලැබිය හැකියි.

චෛත්‍යයක් ඉදිකිරීම බුදුරජාණන් වහන්සේගේ අනන්ත ගුණයට කරන පූජාවකුත් වෙනවා. බොහෝ දෙව් මිනිසුන්ට සිත පහදවා ගෙන කුශල් කරන්න අවස්ථා සලසා දීමකුත් වෙනවා. එනිසාම සම්බුදු සසුනේ චිර පැවැත්මට එය හේතු වෙනවා. චෛත්‍ය ඉදි කිරීමේදී මූලික වෙන, මුදල්



වියදම් කරන අයට පමණක් නොවෙයි, මුදල් ගෙන කුලියට වැඩ කරන අය වුණත් සිත පහදවා ගෙන කළොත් කුශලයේ අඩුවක් නැහැ. රුවන්වැලි මහ සෑය ඉදි කරද්දී වැලි ගඩොල් ඇද්ද, කුලියට වැඩ කළ බොහෝ දෙනා සිත පහදවා ගෙන කළ නිසා අදටත් දෙව්ලොව සැප විඳිනවා.

## ප්‍රාර්ථනාව

එනිසා චෛත්‍ය ඉදිකරන, ඊට සහාය වෙන, වත්පිළිවෙත් කරන, ප්‍රතිසංස්කරණය කරන සැම දෙනාම බුද්ධ ගුණයට කරන පූජාවක් වශයෙන් සිත පහදවා ගෙනම කළ යුතුයි. එහිදී තම තමන්ට වැටහෙන අයුරින් මෙවැනි ප්‍රාර්ථනාවක් ඇතිකර ගැනීමත් සුදුසුයි.

"මේ චෛත්‍යයේ පාදම මත පේසා වළළු, ගර්භය, සතරැස් කොටුව, කොත් කැරැල්ල, කොත, චූඩා මානික්‍යය යන අංග අනු පිළිවෙලින් ගොඩ නගා ඇතුවා මෙන් අපටද මේ කුශල බලයෙන් නිවන් මගෙහි පාදම වැනි වූ ශ්‍රද්ධාවේ පිහිටා, පේසා වළළු වැනි සතර සංවර ශීලයෙන් සංවරව, ගර්භය වැනි සත්තිස් බෝධි පාක්ෂික ධර්ම - පාරමිතා ධර්ම වඩවා, සතරැස් කොටුව මෙන් නොවිසිරෙන ඒකාග්‍රතාවය ඇතිව, කොත් කැරැල්ල බඳු සප්ත විශුද්ධීන්ට පැමිණෙමින්, කොත තබා චෛත්‍ය කර්මාන්තය නිමවන්නා සේ නිවනින් සසර ගමන නිමවන්නට ශක්තිය ලැබේවා. කොත අග චූඩා මානික්‍යයේ දීප්තිය දසත විහිදෙන්නාක් මෙන්, අප ලබන ලොව්තුරු ප්‍රඥාවේ ආලෝකය දසත විහිදුවන්න ශක්තිය ලැබේවා. මේ චෛත්‍යය තුළ සර්වඥ ධාතූන් වහන්සේ සුරක්ෂිත වෙන්නා සේ නිවන් දකින ආත්ම භාවය තෙක් පව්කම් වලින් මනස සුරක්ෂිත කර ගනිමින්, කය මෙන්ම පරිහරණය කරන සම්පත්ද උවදුරු වලින් ආරක්ෂා කර

ගනිමින්, දෙවි මිනිසුන්ට ප්‍රිය මනාපව සුවසේ ගුණ නුවණ වඩන්නට ශක්තිය ලැබේවා."

තම තමන්ගේ පෞද්ගලික අපේක්ෂාවන්ට අනුව අවැඩක් නොවන වෙනත් ඕනෑම යහපත් ප්‍රාර්ථනාවක්ද සිදුකර ගත හැකියි.

**සැමට ධර්මාවබෝධය වේවා!**



# දායකත්වය

- මිදේරපිටියේ ගුණරතන හිමිපාණන් වහන්සේ, විහාරාධිපති, ශ්‍රී සුදර්ශනාරාමය, දීයකඩුව - දෙමව්පියන්ට පිං පිණිස.
- විශ්‍රාමලත් පාඨශාලාචාරිනී ඩී.ඒ. මහතන්තිල මිය, දීයකඩුව - දෙමව්පියන්ට පිං පිණිස.
- විශ්‍රාමලත් පාඨශාලාචාරිනී යූ.එල්. ඇසිලින්නෝනා මිය, දීයකඩුව - දෙමව්පියන්ට පිං පිණිස.
- විශ්‍රාමලත් පාඨශාලාචාරිනී සී. උඩුකල මිය, දීයකඩුව - දෙමව්පියන්ට පිං පිණිස.
- ගුණවර්ධන රාළහාමි, දීයකඩුව - දෙමව්පියන්ට පිං පිණිස.
- ඩබ්ලිව්. ජී. ආරියවතී මිය, දීයකඩුව - දෙමව්පියන්ට සහ විමලදාස පතිරගේ සොහොයුරාට පිං පිණිස.
- හේමන්ත ලියනාරච්චි මයා, විදුලි අධිකාරී, හොරණ - පියාණන්, මාමා ඇතුළු මියගිය ඥාතීන්ට පිං පිණිස.
- විශ්‍රාමලත් හෙදි නිලධාරිනී කේ. පෙරේරා මිය, ගෝවින්න - විශ්‍රාමලත් විදුහල්පති ජී.ඩී. පෙරේරා මහතාට පිං පිණිස.
- නීල් රොහාන් මහතන්තිල මයා, ලංකා විදුලි පුද්ගලික සමාගම, දීයකඩුව.
- ජයතුංග ගමගේ මයා, ලංකා විදුලි පුද්ගලික සමාගම, දීයකඩුව - පියාණන්, සහෝදරිය ඇතුළු මිය ගිය ඥාතීන්ට පිං පිණිස.